## ii පත්‍රය

උපදෙස් :-

- පළමුවන ප්‍රශ්ණය අනිවාර්යය
- අනෙකුත් ප්‍රශ්ණ 02 ක් තෝරාගෙන පළමු ප්‍රශ්ණයද ඇතුලුව සියලුම ප්‍රශ්ණ 03 කට පිළිතුරු සපයන්න

---

(01) පංති කාමරය තුළ සංගීත විෂයට අදාලව සිදුකළ ඇගයීමක් ඇසුරින් පහත දැක්වෙන කරුණු කෙටියෙන් විස්තර කරන්න.

(i) ඇගයීම් ප්‍රභේදයේ නම

(ii) ලැබුණ ගුරු උපදෙස්

(iii) ආධාර කරගත් ඉගෙනුම් උපකරණ (සංගීත භාණ්ඩ,ශ්‍රව්‍යාධාර, දෘෂ්‍යාධාර, ග්‍රන්ථ, ආදී වශයෙන්)

(iv) ඔබට මුහුණ දීමට සිදුවූ ගැටළු

(v) එම ඇගයීම තුලින් ඔබගේ සාමාන්‍ය ජීවිතයට ලබා ගතහැකි ප්‍රයෝජන (ල: 10)

(02) නිර්දේශිත රාග දෙකකට අයත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ

- ❖ කල්‍යාණ ථාටයෙන් බිහිවී ඇත
- ❖ " ග " වාදී ස්වරයයි " නි " සංවාදී ස්වරයයි
- ❖ සියලුම කෝමල ස්වර ඇසුරු කරගනියි
- ❖ රාත්‍රී ප්‍රථම ප්‍රහරය ගායන සමය වේ
- ❖ එන්න මදනලේ , කවාලා විළඳ ජාතී ,වැනි ප්‍රචලිත ගීත මෙම රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇත
- ❖ දිවා ප්‍රථම ප්‍රහරය ගායන සමය වේ
- ❖ " ම " වාදී ස්වරයයි " ස " සංවාදී ස්වරයයි
- ❖ සාදු දන්තදා , අඳුර අඳුර මගේ වැනි ප්‍රචලිත ගීත මෙම රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇත

(i) ඉහත ලක්ෂණ ඇතුලත් රාග දෙක නම් කරන්න. (ල: 02)

(ii) අදාල රාග දෙකට අනුව එම ලක්ෂණ නැවත වගුගත කර ලියා දක්වන්න. (ල: 04)

| ................................................රාගය | ................................................රාගය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(iii) ඉහත රාග දෙකින් එකකට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල: 04)

(03) ශ්‍රී ලාංකීය සංගීතයේ මුල් අවධියේ ප්‍රගමනය සඳහා දායකවූ ග්‍රැමෆෝන් ගීත හෝ කපිරිඤ්ඤා ගීත යන වර්ග දෙකින් එකක දායකත්වය, පහත කරුණු උපයෝගී කරගනිමින් පහදන්න.

(1) ආරම්භය හා ව්‍යාප්තිය (ල: 03)

(2) ගායක ගායිකාවන් (ල: 02)

(3) ප්‍රචලිත ගීත (ල: 02)

(4) සංගීතමය ලක්ෂණ (ල: 03)

(04




ඉහත දක්වා ඇති තබ්ලාවේ රූප සටහන ඇසුරින් පහත සඳහන් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

**(බායාව, ෂියාහි, ලවය, චාන්ටි, බද්ධි, ගජ්රා, ගට්ඨා, දායාව )**

(i) වරහන් තුල දක්වා ඇති කොටස් යොදා ගනිමින් රූප සටහනේ අංක 1 සිට 8 තෙක් කොටස් නම් කරන්න. (ල: 04)

(ii) හින්දුස්ථානී සංගීත පද්ධතියේ එන ජප් තාලය හෝ දීප්චන්දි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න (ල: 03)

(iii)

(1) ඉහත රූප සටහනේ A කොටසින් තනිව වාදනය කල හැකි අවනද්ධ අක්ෂර දෙකක් ලියන්න. (ල: 01)

(2) ඉහත රූප සටහනේ B කොටසින් තනිව වාදනය කල හැකි අවනද්ධ අක්ෂර දෙකක් ලියන්න. (ල: 01)

(3) A හා B යන කොටස් දෙකම උපයෝගී කරගෙන වාදනය කල හැකි අවනද්ධ අක්ෂර දෙකක්

ලියන්න. (ල: 01)

(05) පහත දක්වා ඇති නාදයේ විද්‍යාත්මක පදනම මත නාදයේ ස්වභාවය දැක්වෙන රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත රූප සටහනින් දක්වා ඇත්තේ බටනලාවකින් හා වයලීනයකින් එකම ස්වරය වාදනය කිරීමේදී දක්නට ලැබෙන තරංගයේ හැඩයයි. එය අසමාන බව පෙනේ. ඒ අනුව මෙය නාදයේ කුමන ගුණයද ? එසේ වීමට හේතු පහදන්න. (ල: 03)




(ii) ඉහත රූප සටහනේ එකම භාණ්ඩයෙන් එකම ස්වරය වාදනය කරන අවස්ථා 3 කදී තරංගය ගන්නා හැඩය A , B, C වශයෙන් දක්නට ඇත. එසේ වන්නේ නාදයේ කිනම් ගුණය නිසාද ? ඒ සඳහා හේතු පහදන්න. (ල: 03)




(iii) ඉහත රූප සටහනේ B අක්ෂරයෙන් මධ්‍ය “ ස ” ස්වරය දක්වන්නේ නම් A , C , D රූපසටහන් වලින් දැක්වෙන්නේ කුමන ස්වරයද ? මෙසේ වීමට හේතුව නාදයේ කුමන ගුණයද ? එසේ වීමට හේතු පහදන්න.

(ල: 04)

**වයඹ පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**අවසාන වාර පරීක්ෂණය 2015**
**පෙරදිග සංගීතය**
10 ශ්‍රේණිය ii පත්‍රය
**<u>විසඳුම් පත්‍රය</u>**

(01) පංති කාමරය තුළ සංගීත විෂයට අදාලව ඔබ විසින් සිදුකළ ඇගයීමක් සම්බන්ධව ,සිසුන් ලියා ඇති පිළිතුරු නිවැරදි නම් ලකුණු ලබා දෙන්න.අදාල විස්තරය තුල කරුණු 05 ක් වත් ඇතුලත්විය යුතුය. (ල: 10)

(02)

(i) භෛරවී රාගය සහ යමන් රාගය (ල: 02)

(ii) අදාල රාග දෙකට අනුව එම ලක්ෂණ නැවත වගුගත කර ලියා දක්වන්න.

| භෛරවී රාගය | යමන් රාගය |
|---|---|
| සියලුම කෝමල ස්වර ඇසුරු කරගනියි | කල්‍යාණ ඨාටයෙන් බිහිවී ඇත |
| එන්න මදනලේ , කවාලා විළඳ ජාතී ,වැනි ප්‍රචලිත ගීත මෙම රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇත | සාදු දන්තදා , අඳුර අඳුර මගේ වැනි ප්‍රචලිත ගීත මෙම රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇත |
| දිවා ප්‍රථම ප්‍රහරය ගායන සමය වේ | රාත්‍රී ප්‍රථම ප්‍රහරය ගායන සමය වේ |
| “ ම ” වාදී ස්වරයයි “ ස ” සංවාදී ස්වරයයි | “ ග ” වාදී ස්වරයයි “ නි ” සංවාදී ස්වරයයි |

(ල: 02)

(iii) මධ්‍යලය ගීතයක් නිමිත ස්වර සංඥා සහිතව ගීත ස්වර ප්‍රස්ථාර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල: 04)

(03) <u>ග්‍රැමෆෝන් ගීත</u>

(1) <u>ආරම්භය හා ව්‍යාප්තිය</u> (ල: 03)

- 20 වන සියවසේ ප්‍රථම දශකයේදී ශ්‍රී ලංකා ගමන සිදුවිය
- 1903 දී ශ්‍රී ලංකා වෙළඳ පොලට ග්‍රැමෆෝනය හඳුන්වා දීම සිදුවිය
- මුල් කාලයේදී නූර්ති ගීත රසවිඳීමට හැකිවිය
- නූර්ති ගීත වකවානුවෙන් පසු හිනදි ගී අනුකරණ තනු යුගය දැකිය හැකිය.
- වර්ෂ 1937 න් පසු ස්වාදීන තනු යුගය ආරම්භ විය.

(2) <u>ගායක ගායිකාවන්</u> (ල: 02)

- ග්‍රේස් මාග්‍රට් සිල්වා ,ඇනී බොතේජු ,ලක්ෂ්මී බායි ,එන්.රොම්ලස් ද සිල්වා ,එම් .කේ.වින්සන්ට් ,එච්.ඩබ්ලිව්.රූපසිංහ ,ඉබ්‍රාහිම් , සුසිලා ජයසිංහ , රුක්මණී දේවි , එඩී ජයමාන්න ,

(3) <u>ප්‍රචලිත ගීත</u> (ල: 02)

- ශ්‍රියා මනමත්වි , හරිමි රජසැපා , දේවනේ ලෝකපති , සීතා මා සිරියාවී , පිට දීප දේශ ජයගත්තා , ශ්‍රී රාහුල හිමිගේ නාමේ , රාජ පණ්ඩිත නාග විමානේ , අඩුකලේ සෙලවීම නිසා , දැඩිකල මාතා ,
- ශාන්ත මේ රෑ යාමේ , එන්ඩද මැණිකේ , ලෝ අඩ නින්දේ වැනි ගීත.

(4) සංගීතමය ලක්ෂණ (ල: 03)

- නූර්ති ගීත යුගයේදී එම ගීත සඳහා විශ්වනාත් ලව්ජී වැනි ඉන්දීය සංගීතඥයින්ගේ නිර්මාණ දායකත්වය ලැබිනි.
- හින්දි , ද්‍රවිඩ .සහ ඉංග්‍රීසි ගී තනු අනුකාරක ගීත ඇතුලත් හින්දි තනු යුගයේ ගීතවල නාදමාලාව ප්‍රමුඛස්ථානයක් ගත් අතර රාගධාරී සංගීතය පාදක කරගත් නිසා එම ගීත ඉතා ආකර්ෂනීය විය.
- වර්ෂ 1937 න් පසු ස්වාදීන තනු යුගය ආරම්භ වූ අතර ඒ සඳහා ආනන්ද සමරකෝන් මහතා දැඩි කැපවීමකින් කටයුතු කළ අතර, එමගින් වංග සංගීතයේ ගී තනු සහ ජන නාද රටා නාද මාලා වලට එක්වුනි.
- පියානෝ , මැන්ඩලීනය , ගිටාරයට අමතරව වෙනත් සංගීත භාණ්ඩ භාවිතා කර ඇත.

## කපිරිඤ්ඤා ගීත

(1) ආරම්භය හා ව්‍යාප්තිය (ල: 03)

- පෘතුගීසීන් සහ කාපිරි ජනයා අතර ප්‍රචලිතව තිබූ ගීත සම්ප්‍රදායකි.
- ලංකාවට පැමිණි පෘතුගීසී හමුදාවේ වහල් මෙහෙයට පැමිණි කාපිරි ජනයා අතර භාවිතා වී පසුව සාමාන්‍ය ජනයා අතරට පත්විය.
- පුත්තලම , මඩකලපුව යන ප්‍රදේශවල සහ මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත විය.
- පසුකාලීන සරල ගී ගායකයින් මෙම ගී ආර තම නිර්මාණ සඳහා ඇසුරු කොට ගැනීම.

(2) ගායක ගායිකාවන් (ල: 02)

- සී.ටී.ප්‍රනාන්දු , එම්.එස්.ප්‍රනාන්දු , සමන්ද සිල්වා ,

(3) ප්‍රචලිත ගීත

- රස ආහහර කවලා , මී වදයකි ජීවිතේ , යමං බන්ඩො වෙසක් බලන්න , නා නා වියෝලේ , කුස්සි අම්ම සේරා , (ල: 02)

(4) සංගීතමය ලක්ෂණ (ල: 03)

- සරල තනු තිබීම
- වේග රිද්ම ගායන හා වාදන තිබීම
- කෙම්ටෝ තාලයට නිර්මාණය වීම
- 6/8 රිද්මය විශේෂ වීම
- ස්පාඤ්ඤ භාෂාව යොදා තිබීම
- ගීතයේ වේගය ක්‍රමයෙන් වැඩිවීම
- බාල මහළු සියලු දෙනා ගායනයට හා නැටුමට යොමුවීම
- වයලීනය , වියෝලාව , රබාන , බැන්ජෝ සහ වෙනත් ආදේශ භාණ්ඩ වාදනය
- මංගල අවස්ථාවල මෙම ගීත සඳහා විශේෂ තැනක් ලැබීම
- ගී තනුවල “ ල ” කාරය භාවිතා කිරීම

(04)

(i) 1. **ෂියාම්** **2.** **ලවය** **3.** **වාන්ටි** **4.** **ගජ්රා** (ල: 04)

**5.** ගවියා **3.** බද්ධි **7.** දායාව **8.** බායාව

(ii) <u>ජප් තාලය</u>

| මාත්‍රා | 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 |
|---|---|---|---|---|
| ඨේකාව | ධි නා | ධි ධි නා | ති නා | ධි ධි නා |
| තාල සංඥා | X | 2 | 0 | 3 |

<u>දීප්චන්දි තාලය</u>

| මාත්‍රා | 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
|---|---|---|---|---|
| ඨේකාව | ධා ධිං - | ධා ධා ධිං - | තා තිං - | ධා ධා ධිං - |
| තාල සංඥා | X | 2 | 0 | 3 |

(ල: 03)

(iii) (1) නා , තා , තිං , තුං , ති , ට (ල: 01)

(2) ගෙ , ග , කත් , කි (ල: 01)

(3) ධා , ධිං , තිරිකිට , ධි (ල: 01)

The National e-learning Portal for The General Education

(05)

(i) මෙය නාදයේ ධ්වනි ගුණයයි. (ජාතිභේදය) (ල: 03)

සංගීත භාණ්ඩ වලට ආවේනික වූ ධ්වනි ගුණයක් ඇත.සංගීත භාණ්ඩයෙන් භාණ්ඩයට වෙනස් වන මෙම ධ්වනි ගුණය සඳහා බලපාන හේතු කීපයක් ඇත.එනම් භාණ්ඩයේ හැඩය හා ප්‍රමාණය , නාදය උත්පාදනය කරණ පිළිවෙල සහ යොදාගන්නා උපකරණ , එම භාණ්ඩය නිපදවීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය ආදී කරුණු වේ. ඉහත කරුණු අනුව බටනලාවේ හා වයලීනයේ ධ්වනි ගුණය වෙනස් වේ.

(ii) මෙය නාදයේ විපුලතාවයයි. (රූපභේදය) (ල: 03)

මෙම ගුණය ඇතිවීමට හේතුව වන්නේ වාදනයේදී යොදනු ලබන ශක්තියයි.එහිදී තරංගයේ විස්තාරය අඩු වැඩි වේ.යොදන ශක්තිය වැඩිනම් තරංග විස්තාරය වැඩිවන අතර හඬේ සැර වැඩි වී වැඩි හඬක් උපදී.යොදන ශක්තිය අඩුවූ විට තරංග විස්තාරය අඩු වන අතර හඬේ සැර අඩු වී වැඩි හඬක් සිහින් හඬක් උපදී.මෙම ගුණය නාදයේ විපුලතාවයයි.

(iii) A - මන්ද්‍ර සඩ්ජය (ස) - සංඛ්‍යාතය - 128 Hz (ල: 04)

C - උච්ච සඩ්ජය (ස්) - සංඛ්‍යාතය - 512 Hz

D - අති උච්ච සඩ්ජය (ස්) - සංඛ්‍යාතය - 1024 Hz

මෙය නාදයේ තාරතාවයයි. (උච්චනීචභේදය)

ස,රි,ග,ම, ආදී වශයෙන් ස්වර අතර ඇති හඬේ උස් පහත් බව තාරතාවයයි.මෙයට හේතුව වන්නේ සංඛ්‍යාතයයි.නාද උත්පාදකයේ දිග අඩු වැඩි වීම , ප්‍රමාණය සහ ඝණකම ඵ නාද උත්පාදකයේ ආතතිය වැනි කරුණු හේතුවේ.තරංග ආකාරයට ගතහොත් තරංග ආයාමය කෙටිවන විට සංඛ්‍යාතය ඉහළ යන බව දැකිය හැකිය.

The National e-learning Portal for The General Education